(6)

පොදු චක්‍ර ලේඛ අංකයː- 02-90/2014

මගේ අංකයː- ටීසීඑස්/බී/33/2014
සෞඛ්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
2014/ 08/ 28

සියළුම පළාත් ලේකම්වරුන්,
සියළුම පළාත්/නියෝජ්‍ය පළාත්/ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියළුම විමධ්‍යගත සෞඛ්‍ය සේවා අංශ ප්‍රධානීන්,
සියළුම ශික්ෂණ රෝහල්/පළාත් මහ රෝහල් සහ විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
සියළුම වෛද්‍ය අධිකාරිවරුන් සහ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්.

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂඥ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**
**(අවසාන සේවා ස්ථාන)**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් විශේෂඥ වෛද්‍යවරුන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. විශේෂඥවරු ලෙස මණ්ඩලයේ සහතික ලත් නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් භාරගනු ලබන අතර, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය විසින් සිදු කරනු ලබන තාවකාලික මණ්ඩල සහතික කිරීම මත අයදුම් කරන නිලධාරීන්ගේ අයදුම්පත් භාර නොගැනේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩුවල ලයිස්තුවක් අදාල තොරතුරු සමඟ පහත දක්වා ඇත.

| ස්ථානය | තනතුර | තනතුරු ගණන | ලකුණු ගණනය කරනු ලබන්නේ |
|---|---|---|---|
| රිජ්වේ ආර්යා ළමා රෝහල - කොළඹ | නිර්වින්දන විශේෂඥ වෛද්‍ය | 01 | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය තෙක් |
| රිජ්වේ ආර්යා ළමා රෝහල - කොළඹ | හෘද උරස් නිර්වින්දන විශේෂඥ වෛද්‍ය | 01 | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය තෙක් |
| ශික්ෂණ රෝහල - කළුබෝවිල | අන්ත්‍රවේදී විශේෂඥ වෛද්‍ය | 01 | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය තෙක් |
| ශික්ෂණ රෝහල – මහනුවර | විකිරණවේදී විශේෂඥ වෛද්‍ය | | 2014/08/08 |
| ජාතික රෝහල - කොළඹ | විකිරණවේදී විශේෂඥ වෛද්‍ය | 01 | 2014/09/21 |
| ජාතික රෝහල - කොළඹ | කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය | 01 | 2014/09/14 |
| ජාතික රෝහල - කොළඹ | කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය | 01 | 2014/09/29 |
| ශික්ෂණ රෝහල - කළුබෝවිල | සාමාන්‍ය ශල්‍ය වෛද්‍ය | 01 | 2014/09/28 |

2001 මාර්තු 22 දිනැති අංක 1176/15 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත සෞඛ්‍ය සේවා ව්‍යවස්ථාවට අනුව පත්වීම් දෙනු ලැබේ.

ආයතන ප්‍රධානීන් විසින් මෙම චක්‍රලේඛය පිළිබඳ තම ආයතනයේ සේවය කරනු ලබන සියළුම විශේෂඥ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කල යුතුය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මෙහි අමුණා ඇති ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2014/08/04 දින හෝ ඊට පෙර ආයතන ප්‍රධානීන් මහින් සහ විමධ්‍යගත අංශ ප්‍රධානීන් මහින් මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය. **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** සෑම පිටපතක් පහත සඳහන් පහත සඳහන් ලිපිනයට එවන මෙන් මෙයින් දන්වමි.

අධ්‍යක්ෂ (තෘතීයික සත්කාර සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අයදුම්පත් ඉවත් කර ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දින සිට සති දෙකක් (02) ඇතුලත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ට ලිඛිතව දැන්වීමෙන් එසේ කළ යුතුය. අයදුම්පත් ඉවත් කර ගැනීම සඳහා පසුව කෙරෙන ඉල්ලීම් බාර නොගන්නා අතර, අයදුම්කරු තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය තනතුර බාර ගත යුතුය.

උපාධි සහ පශ්චාත් උපාධි ඉගැන්වීම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම විශේෂඥවරුන්ගේ රාජකාරියේ වැදගත් කොටසකි. තෝරාගනු ලබන අපේක්ෂකයින් මෙම කාර්ය ඉටු කිරීමට එගත විය යුතුය.

වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා තෘතීයක සත්කාර සේවා අධ්‍යක්ෂ වෛද්‍ය පී.එල්. අතපත්තු මහතාගෙන් විමසන මෙන් සියළුම ආයතන ප්‍රධානීන්ගෙන් හා විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

සුධර්මා කරුණාරත්න
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

**සුධර්මා කරුණාරත්න**
**ලේකම්**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**"සුවසිරිපාය"**
**385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**

පිටපත්:-

1. ලේකම්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
2. අධ්‍යක්ෂ, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය